රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 03/2016 (III)

මගේ අංකය : EST 5/4/24(XIX)-6
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.06.14

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2016</u>**

ඉහත කරුණට අදාළව නිකුත් කරන ලද 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි 06 ඡේදය වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී ඡේදයේ 6.1 උප ඡේදය පහත පරිදි සංශෝධනය කිරීම සඳහා 2018.05.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

"**06. වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් ගෙවනු ලබන දීමනා**

**6.1 කිසියම් ආයතනයක හෝ සේවාවක/ තනතුරක හෝ නිලධරයන් සඳහා වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් හෝ/ සහ වැටුප මත ගණනය කර ගෙවනු ලබන සියලුම දීමනා 2018.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්තමාන වැටුපෙහි මූලාමය අගය පදනම් කර ගනිමින් ගණනය කළ යුතු ය.**"

03. මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය